# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2443/49 - 2025 ජූලි මස 02 වැනි බදාදා - 2025.07.02**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත**

155 (1) වගන්තිය යටතේ සාදන ලද නියෝග

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 155 වගන්තියේ (1) උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙම නියෝගය මගින්, ඉහත කී පනතේ 155 වගන්තියේ (1) උප වගන්තිය යටතේ අය කරනු ලබන සෙස් බද්දේ අනුප්‍රමාණයන් මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් නිශ්චිත පරිදි දක්වමි.

2017 ජුනි 19 වන දිනැති අංක 2024/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2023 ජනවාරි 26 වන දිනැති අංක 2316/32 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රසිද්ධියට පත් කරන ලද සෙස් බද්දේ අනුප්‍රමාණයන්ට අදාළව නිකුත් කරන ලද නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

මෙම නියෝගය 2025 අගෝස්තු මස 01 දින සිට බලාත්මක වේ.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය.

2025 ජූලි මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

**උපලේඛනය**

| *අයිතමය* | *සුරැකුම්පත් වර්ගය* | *අනුප්‍රමාණය* |
|---|---|---|
| 1 | ලැයිස්තු ගත කොටස් සම්බන්ධයෙන් අදාළ අනුප්‍රමාණයන් - | |
| | (i) (අ) දේශීය ආයතන විසින් නිකුත් කර ලැයිස්තුගත කර ඇති ශ්‍රී ලංකා රුපියල් වලින් වටිනාකමින් යුක්ත කොටස්වල සෑම ගණුදෙනුවක් සඳහාම ගණුදෙනුවේ වටිනාකමෙහි පළමු රුපියල් මිලියන 100 ද ඇතුලුව පළමු රුපියල් මිලියන 100 දක්වා වන ගණුදෙනු<br><br>(ආ) දේශීය ආයතන විසින් නිකුත් කර ලැයිස්තුගත කර ඇති විදේශ මුදල් වල වටිනාකමින් යුක්ත කොටස්වල සෑම ගණුදෙනුවකම ගණුදෙනුවේ වටිනාකමෙහි පළමු ඇමරිකානු ඩොලර් 500,000 ද ඇතුලුව පළමු ඇමරිකානු ඩොලර් 500,000 දක්වා හෝ ඊට සමාන වටිනාකමකින් යුත් වෙනත් මුදල් ඒකකයකින් සිදුකළ ගණුදෙනු | ගණුදෙනුවේ වටිනාකමෙන් 0.072% ක් |
| 2 | (ii) (අ) දේශීය ආයතන විසින් නිකුත් කර ලැයිස්තුගත කර ඇති ශ්‍රී ලංකා රුපියල් වලින් වටිනාකමින් යුක්ත කොටස්වල සෑම ගණුදෙනුවකම ගණුදෙනුවේ වටිනාකමෙහි පළමු රුපියල් මිලියන 100 වඩා වැඩි අගයන්<br><br>(ආ) දේශීය ආයතන විසින් නිකුත් කර ලැයිස්තුගත කර ඇති විදේශ මුදල් වලින් වටිනාකමින් යුක්ත කොටස්වල සෑම ගණුදෙනුවකම ගණුදෙනුවේ වටිනාකමෙහි පළමු ඇමෙරිකානු ඩොලර් 500,000 ට වඩා වැඩි හෝ ඊට සමාන වටිනාකමකින් යුත් වෙනත් මුදල් ඒකකයකින් සිදුකළ ගණුදෙනු | ගණුදෙනුවේ වටිනාකමෙන් 0.0450% ක් |
| | සාංගමික ණය සුරැකුම්පත් (පොදු ලැයිස්තුගත සමාගම්වල ලැයිස්තුගත ණයකර සහ ලැයිස්තුගත නොකළ ණයකර) සම්බන්ධයෙන් අදාළ වන අනුප්‍රමාණයන් | ගණුදෙනුවල මුළු වටිනාකම x 0.01%, 3 න් බෙදීමෙන් ලැබෙන අගය |
| | ලැයිස්තුගත ඉහළ ප්‍රතිලාභයක් සහිත සාංගමික ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් අදාළ වන අනුප්‍රමාණයන් | ගණුදෙනුවේ වටිනාකමෙන් 0.006% ක් |
| | කොළඹ කොටස් හුවමාරුවෙහි 'වෙළෙඳපොළින් බැහැර ගණුදෙනු වේදිකාවේ' සිදු කරන සමාගම් විසින් නිකුත් කරන ලද සාංගමික ණය සුරැකුම්පත්වල සෑම ප්‍රතිමිලදී ගැනීමේ ගණුදෙනු | ප්‍රතිමිලදී ගැනීමේ ගණුදෙනු වටිනාකමෙන් 0.006% ක් |
| 3 | ලැයිස්තුගත ඒකක භාරවල ඒකක සම්බන්ධයෙන් අදාළ වන අනුප්‍රමාණයන් | ගණුදෙනුවේ වටිනාකමෙන් 0.02% ක් |
| සෙස් බද්ද සඳහා අදාළ ඉහත සඳහන් කළ ගණුදෙනු වටිනාකම වන්නේ එකම සුරැකුම්පතක් සඳහා එකම වෙළඳ දිනයේදී එකම කොටස් තැරැව්කාර සමාගමක් හරහා පුද්ගලයෙකු විසින් සිදු කරන ලද ගණුදෙනුවල මුළු වටිනාකමයි. | | |

EOG 07 - 0099

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.